**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2020**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 11 වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | ------------------- |
| (අ) | Updating the Primary Health Performance Initiative (PHCPI) ව්‍යාපෘතිය විසින් 2019 වර්ෂයේදී අරමුදල වෙත පරිත්‍යාග කර තිබුණු රු.16,961,796 කින් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය වෙත ආපසු යවා තිබුණු රු.5,180,025 ක් පරිත්‍යාග ආදායමෙන් අඩුකර දැක්වීම වෙනුවට වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආපසු යවා තිබුණු මුදල වැරදීමකින් 2020 වර්ෂයට අදාළ වියදමක් ලෙස දක්වා ඇති බව හා ගිණුම්කරණ දෝෂයක් බව පිළිගන්නා බව. | මෙම වරද නිවැරදි කර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | අරමුදලේ ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කරන බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු නමුත් ඊට අනුකූල නොවන පරිදි ජාතික අක්ෂි බැංකුවට අදාළ ආදායම් හා වියදම් මුදල් පදනම මත හෙළිදරව් කර තිබුණි. තවද ජාතික අක්ෂි බැංකුවට අදාළ ආයෝජන හා බැංකු ගිණුම්වල ශේෂ පමණක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු නමුත් ජාතික අක්ෂි බැංකුවට අදාළ ස්ථාවර වත්කම්, අනෙකුත් ජංගම වත්කම් හා ජංගම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. එසේම එම වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ජාතික අක්ෂි බැංකුව ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට අයත් වෙනම ආයතනයක් හැටියට නොව ව්‍යාපෘතියක් හැටියට ක්‍රියාත්මක වන බව, ඒ අනුව අනිකුත් කෙටි කාලීන ව්‍යාපෘති මෙන් අදාළ ආදායම් හා වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව, එම ආදායම් හා වියදම් මුදල් පදනම මත ගිණුම් කර ඇති බව, අක්ෂි බැංකුව සඳහා අදාළ වර්ෂයේ ආයෝජන හෝ ස්ථාවර වත්කම් මිලදී ගෙන නොමැති බව, ස්ථාවර වත්කම් ප්‍රධාන ආයතනය විසින් පරිත්‍යාග කරන ලද වත්කම් බව, තවද ජාතික අක්ෂි බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව මෙතෙක් තීරණයක් ගෙන නොමැති බව හා අක්ෂි රෝහල වෙත පැවරීම හෝ වෙනම ආයතනයක් ලෙස පවත්වා ගැනීම පිළිබඳව කටයුතු කරමින් සිටින බව. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ ආදායම් හා වියදම් මෙන්ම ජාතික අක්ෂි බැංකුවේ ගණුදෙනුද උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. එසේම ජාතික අක්ෂි බැංකුව සතු වත්කම් හා වගකීම් පිළිබඳ සියළු තොරතුරු ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. ජාතික අක්ෂි බැංකුව වෙනම නෛතික ඒකකයක් වශයෙන් ස්ථාපිත වන තෙක් එහි සියලුම ගණුදෙනු ගිණුම්ගත කිරීමටත්, එම දත්ත හා තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 381 | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2016 වර්ෂයේදී ලංකා බැංකුවේ ඉතිරි කිරීම් ගිණුමක් ආරම්භකර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.16,911,230 ක් විය. | මුදල් රෙගුලාසි 381 අදාළ වන්නේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිල බැංකු ගිණුම් සඳහා බව, ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බව, ලංකා බැංකු නිල ගිණුම මගින් අරමුදලේ ගණුදෙනු සිදු කරන බව, අරමුදලේ පාලක මණ්ඩලයේ උපදෙස් හා අනුමැතිය මත පොලී ආදායම් ලබා ගැනීමේ අරමුණින් සහ ජංගම ගිණුමේ ශේෂය පාලනය කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී ඉතිරි කිරීම් ගිණුම ආරම්භ කරන ලද බව, සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය ලබා ඇති බව හා මේ සම්බන්ධව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසූ විට මේ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් අවශ්‍ය නොවන බව වාචිකව දන්වන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 4 කට වැඩි කාලයක සිට පැවත එන වැඩ නිමවූ කොන්ත්‍රාත් 19 කට අදාළ නිරවුල් නොකළ රඳවාගැනීමේ මුදල් රු.6,910,491 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොකර ඇති රඳවා ගැනීමේ මුදල් අරමුදලේ ආදායමට බැර කිරීම සම්බන්ධව කටයුතු කරමින් සිටින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.80,133,424 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.90,462,688 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,329,264 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම, වෙනත් රාජ්‍ය ආයතනවලින් කරනු ලබන මාරු කිරීම්, පරිත්‍යාග හා වෙනත් ආදායම් රු.211,250,260 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුම හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 2013 අගෝස්තු 29 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් ලෙස ස්ථාපිත කිරීමට හා එහි ගනුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2021 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු පනත මේ වනවිට කැබිනට් මණ්ඩලයට යොමු කිරීමට සූදානම් කර ඇති බව, අමාත්‍යාංශයේ නීති අංශය මේ සම්බන්ධව කටයුතු කරමින් සිටින බව හා පනත සම්මතවී ජාතික අක්ෂි බැංකුව නෛතික ආයතනයක් ලෙස ස්ථාපිත වූ පසුව වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව වෙනම ආයතනික ව්‍යුහයක් සහිත නෛතික ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කරන තෙක් එහි කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමටද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා වැටුප් ගෙවීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ වී නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ නොහැකිව තිබුණි. | අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/13/1172/509/052 දරන 2013 සැප්තැම්බර් 06 දිනැති කැබිනට් මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථා පනවන තෙක් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී ඇති බව. | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව, ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බවත්, ඒ අනුව කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බවත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතු අතර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 149(1) වගන්තිය ප්‍රකාරව සියළුම අය බදු, තීරු බදු, වරිපනම් හා ගාස්තු යන මාර්ගවලින් ලැබෙන ආදායම්ද, නියමිත කාර්ය සඳහා වෙන් කරනු නොලැබූ ජනරජය සතු සෙසු සියලුම ආදායම් සහ ලැබීම්ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. කෙසේ වුවද 2009 අගෝස්තු මාසයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළදී ජාතික රුධිර පාරවිලයන සේවය රුධිර ප්ලාස්මා විකිණීමෙන් උපයා තිබුණු රු.133,219,064 ක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට බැර කර තිබුණි. එම මුදලින් රු.120,047,670 ක් 2019 අගෝස්තු මස ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා නැවත රුධිර පාරවිලයන සේවයට යවා තිබුණු නමුත් රුධිර ප්ලාස්මා විකිණීමෙන් ලැබී තිබුණු රු.13,171,394 ක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර තවදුරටත් අරමුදල තුළ රඳවාගෙන තිබුණි. | 2009 අගෝස්තු සිට 2018 වර්ෂය දක්වා කාලය තුලදී ජාතික රුධිර පාරවිලයන සේවය විසින් රුධිර ප්ලාස්මා විකිණීමෙන් උපයා තිබුණු රු.120,047,670 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද්දේ 2018 වර්ෂයේ නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාව අනුව බව හා ඉතිරි මුදල වන රු.13,171,394 ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව. | රුධිර ප්ලාස්මා විකිණීමෙන් ලැබී තිබුණු මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා නැවත රුධිර පාරවිලයන සේවයට යැවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 4 සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක් තුළ ලැබිය යුතුව තිබුණු එකතුව රු.1,382,346 ක ණයගැති ශේෂ මෙම වාර්තාවේ දිනය වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | ඉදිකිරීම් නියමිත පරිදි අවසන් නොකිරීම හේතුවෙන් මුදල් කර ගත යුතුව තිබුණු සෙලින්කො රක්ෂණ සමාගම විසින් නිකුත්කර තිබුණු කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම රු.1,372,346 ක් අය කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත ලිපි යවා ඇති බව. | දීර්ඝ කාලයක සිට අයකර ගත නොහැකිවී තිබුණු මෙම මුදල අයකර ගැනීමට හෝ අයකර නොගැනීමට වගකිව යුතු පාර්ශවයන් වෙතොත් ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ විධිමත් පරිදි පොත්වලින් කපාහැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කාර්යයන් අවසන්ව තිබුණු ව්‍යාපෘති 13 කට අදාළව රු.මිලියන 2.3 ක් පරිත්‍යාග කළ ආයතන වෙත ආපසු යැවීමට හෝ පොදු අරමුදල වෙත පවරාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යයන් අවසන්වී ඇති ව්‍යාපෘතීන්ට අදාළව පවතින පරිත්‍යාග මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන පොදු අරමුදලට බැර කිරීමට කටයුතු කරමින් පවතින බව. | ව්‍යාපෘතිවලට අදාළ අවබෝධතා ගිවිසුම් හෝ එකඟතා ප්‍රකාරව කටයුතු කළ යුතුය. එසේ නැතහොත් ඉතිරි මුදල් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ පොදු අරමුදල වෙත පවරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපොළට හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 15 ක ප්‍රදානයක් 2015 මැයි 26 දින ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලබාදී තිබුණු අතර, ඒ වෙනුවෙන් නව නිෂ්පාදන එක් ඒකකයක ලාභයෙන් සියයට 10 බැගින් මාසිකව අරමුදලට බැර කිරීමට සංස්ථාව ප්‍රතිපත්තිමය වශයෙන් එකඟවී තිබුණි. 2015 ජූනි මාසයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සංස්ථාව විසින් අරමුදල වෙත රු.1,260,427 ක් පමණක් එවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව වෙතින් කිසිදු මුදලක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපොළට හඳුන්වාදෙමින් නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා 2015 වර්ෂයේදී මෙම රු.මිලියන 15 ප්‍රදානය කරන ලද්දේ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනත අනුව ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවා සපයන ආයතනයන් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය සඳහා බව, 2015 සිට 2019 දක්වා කාලය තුළ ආයුර්වේද සංස්ථාව විසින් අලෙවි ආදායමෙන් රු.1,260,427.28 ක මුදලක් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට ගෙවා ඇති බව හා 2020 වර්ෂයට අදාලව මුදල් ගෙවන ලෙස සිහි කැඳවීම් යවා ඇති බව. | ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ ඇති එකඟතාව පරිදි අරමුදලට ලැබිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | රජයේ රෝහල් සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීමට හා රෝහල් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමේ අරමුණින්, සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය 1998 සැප්තැම්බර් මාසයේදී හඳුන්වාදී තිබුණු අතර සෑම දිනුම් අදින වාරයකටම ප්‍රථමයෙන් එම වාරයේ අරමුදලින් කෙරෙන කාර්යය හඳුනාගෙන ප්‍රකාශයට පත් කර එකී කාර්යය ඉටු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. 2014 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණු රු.399,767,068 ක ලොතරැයි ආදායමෙන් රෝහල් සඳහා උපකරණ මිලදී ගැනීමට සහ රෝහල් අළුත්වැඩියා කටයුතු ආදී අරමුණුගත කාර්යයන් සඳහා පිළිවෙලින් රු.20,578,392 ක් හා රු.86,344,001ක් පමණක් වැය කර තිබුණු අතර එය සමස්ත ලොතරැයි ආදායමෙන් සියයට 21 ක් පමණක් විය. | ඉදිරි වර්ෂවලදී මේ සම්බන්ධව කටයුතු කිරීමට අවධානය යොමු කර ඇති බව. | සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා එම අරමුදල් උපයෝජනය කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | අරමුදල වෙත 1996 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිශ්චිත කාර්යයන් 11 ක් සඳහා ලැබී තිබුණු රු.මිලියන 8.09 ක පරිත්‍යාග වර්ෂ 3 ක සිට වර්ෂ 17 ක කාල | මෙම පරිත්‍යාග උපයෝජනය කර අරමුණුගත කාර්යයන් ඉටුකර ගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | අරමුදල වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති අරමුදල් අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | පරාසයක් තුළ එම අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | | යුතුය. |
| (ආ) | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකිවන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් හා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කර ගන්නා ආකාරය පිළිබඳ වැඩසටහන් පිළියෙළ කර නොතිබුණි. 2020 ජනවාරි 01 දිනට පොදු අරමුදලේ බැර ශේෂය රු.411,069,837 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.144,191,754 ක් අරමුදලට බැර වී තිබුණි. එබැවින් උපයෝජනය කළ හැකිව තිබුණු අරමුදල් රු.555,261,591 ක් වුවද, ඉන් රු.49,280,114 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනයකර තිබුණි. ඒ අනුව අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය සියයට 9ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට ලැබෙන මුදල්, ඒවා ලැබුණු වර්ෂයේදීම උපයෝජනය නොකරන බව, ජාතික අයවැයෙන් දිවයිනේ සියළුම සෞඛ්‍ය සේවා සපයන ආයතනයන්හි සංවර්ධනය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන බව හා ජාතික අයවැයෙන් ප්‍රතිපාදන සපයනු නොලබන හදිසි අවශ්‍යතාවයන් සඳහා අරමුදලෙන් ප්‍රතිපාදන සපයනු ලබන බව. | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකිවන පරිදි සැලසුම් හා වැඩ සටහන් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |